# විදේශ සේවා නියුක්තිය සහ ග්‍රාමීය කුටුම්භ සංවර්ධනය (නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**ජේ.එම්.ඩී. ජයසේකර**[1]

**වරුණිකා ප්‍රනාන්දු** [2]

**සංක්ෂේපය**

ආර්ථීක සංවර්ධනයෙහි ප්‍රධාන අංශයක් ලෙස විදේශ සේවයේ නියුක්ත ශ්‍රී ලාංකිකයන් මගින් මෙරටට ගලා එන ප්‍රේෂණ හඳුන්වාදිය හැකිය. නමුත් මේ පිළිබඳ සිදුකර ඇති පූර්ව අධ්‍යයනයන්ට අනුව ගෘහ සේවය හඳහා මැදපෙරදිග බලායන කාන්තාවන් නිසා ඔවුන්ගේ කුටුම්භය කෙරෙහි අහිතකර ප්‍රතිඵල රාශියක් මේ මඟින් අත් වී තිබේ. මේ හා සාපේක්ෂව පුරුෂ පාර්ශවය දකුණු කොරියාව වැනි රටවලට විදේශ සේවය සඳහා විගමනය වීමෙන් ඔවුන්ගේ කුටුම්භය කෙරෙහි සාර්ථක බලපෑමක් එක්කර ඇති බව පෙනී යයි. විදේශ ගතවීමට බලපෑ හේතු, පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව, විදේශ ගත වූ රට, විදේශ ගතවීමට පෙර/පසු රැකියාව, ආදායම්, වියදම් තත්ත්වය, දෙමාපියන් විදේශ ගතවීම දරුවන්ට කළ යහපත් අයහපත් බලපෑම් යන සාධක ඔස්සේ විදේශ සේවා නියුක්තිය මඟින් ග්‍රාමීය කුටුම්භ සංවර්ධනයක් සිඳුවී ද? නැද්ද? යන්න විශ්ලේෂණය කිරිම මෙමෙ අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වේ.

අධ්‍යයන ප්‍රදේශය ලෙස රත්නපුර දිස්ත්‍රික්කයේ නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පාතකඩ, යක්දෙහිවත්ත, නොරගල්ල යන ග්‍රාම නිලධාරී වසම් තුන තෝරාගත් අතර ප්‍රශ්නාවලියක් භාවිත කරමින් ප්‍රාථමික දත්ත ලබාගන්නා ලදී. ඒ සඳහා සරල සසම්භාවී නියැදුම් ක්‍රමය මත ග්‍රාමීය කුටුම්භ 60 ක නියදියක් සමීක්ෂණය සඳහා යොදාගනිමින් දත්ත විශලේෂණය සිදුකර ඇත.

මෙහි ප්‍රධාන අධ්‍යයන ප්‍රතිඵලය ලෙස ගෘහ සේවය හඳහා මැදපෙරදිග බලා යන කාන්තාවන් නිසා ඔවුන්ගේ කුටුම්භය කෙරෙහි අහිතකර ප්‍රතිඵල රාශියක් මේ මඟින් අත් වී ඇති බවත් මේ හා සාපේක්ෂව පුරුෂ පාර්ශ්වය දකුණු කොරියාව වැනි රටවලට විදේශ සේවය සඳහා විගමනය වීමෙන් ඔවුන්ගේ කුටුම්භ කෙරෙහි සාර්ථක බලපෑමක් එක්කර ඇති බවත් නේනුම් කරන ලදී. අධ්‍යයන සමීක්ෂණයට අනුව විදේශ සේවය සඳහා වැඩි වශයෙන් ජනතාව යොමු වන්නේ කුටුම්භය මුහුණ දෙන ආර්ථීක ප්‍රශ්න හේතුවෙනි. මෙහිදී විදේශ සේවා නියුක්තිය මඟින් කුටුම්භයට වූ යහපත් ප්‍රතිඵල අතර නිවසක් ඉදිකර ගැනීමට හැකිවිම හෝ නිවසේ අලුත් වැඩියා කටයුතු කර ගැනිමට හැකිවිම, නව ඉඩමක් මිලදි ගැනීමට හැකිවීම, නවීන බඩු භාණ්ඩ මිලදී ගැනීමට හැකිවීම, දරුවන්ගේ අධ්‍යයාපන කටයුතු සඳහා යෙදවීමට හැකිවිම යනාදියයි. අයහපත් ප්‍රතිඵල අතර දරුවන්ගේ අධ්‍යයාපන කටයුතු අඩාල විම, දරුවන් හිතුවක්කාරී දිවිපෙවෙතක් ගත කිරිම, දික්කසාදවීම්, මානසික ව්‍යාකූලතාවයන් ඇතිවීම යනාදිය හඳුන්වාදිය හැකිය. මෙමෙ තත්ත්වය මත විශේෂයෙන් කාන්තාවන් ගෘහ සේවය සඳහා නික්ම යන ප්‍රමාණය සීමා කිරිමටත්, පුරුෂයන් විදේශ ගත වන ප්‍රමාණය ඉහළ නැංවීමටත් විදේශ සේවා නියුක්ති කාර්යාංශය මෙමෙ සාධක කෙරෙහි වැඩි අවධානයක් යොමුකර ඉදිරි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම වැදගත් වේ.

මුඛ්‍ය පදඃ විදේශ සේවා නියුක්තිය, ග්‍රාමීය අංශය,

*1. භූගෝල විද්‍යාව, භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*